දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, Fax : 2784825

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No.

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

**ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල**
இசுருபாய ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை, பத்தரமுல்ல.
"Isurupaya", Sri Jayawardhanapura Kotte. Battaramulla.

මගේ අංකය / எமது இல. / MyNo. — ඊඩී/03/20/02/01/02/New

දිනය / திகதி / Date — 2016/12/ 6

**චක්‍රලේඛ අංකය - 28 /2016**

සියලු ම

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්

පාසල්වල විදුහල්පතිවරුන්

## නුපුහුණු ගුරුවරුන් සඳහා ගුරු විද්‍යාල විසින් අවුරුදු දෙකක ගුරු පුහුණුව ලබා දීම

සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය සම්පතක් වන ගුරුවරයාගේ සාර්ථකත්වයේ ප්‍රධාන සාධකය ගුරු අධ්‍යාපනය හා ගුරු පුහුණුවයි. දැයේ අනාගතය ගොඩනැගීම සඳහා ගුරුවරයා හට සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇත. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තුළින් යහපත් ආකල්පවලින් පිරුණු දැනුමින් සන්නද්ධ අනාගත පරපුරක් බිහිකිරීමට නම් ගුරුවරයා දැනුමින් හා ගුණාත්මක බවින් සංවර්ධනය විය යුතුය. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කරමින් දැනුමින්, කුසලතාවයෙන් හා අත්දැකීම් වලින් පිරිපුන් ගුරුවරයෙක් බිහිකිරීම ගුරු විද්‍යාල මගින් ක්‍රියාත්මක කරනු ලබන ගුරු පුහුණුවේ ප්‍රධාන ඉලක්කය වේ.

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව පාසල් පද්ධතියේ සෑම නුපුහුණු ගුරුවරයෙක්ම පුහුණු ගුරුවරයකු බවට පත්විය යුතු අතර ඒ සඳහා උචිත ක්‍රමවේද අනුව සැකසූ ගුණාත්මක පුහුණුවක් දෑ අවුරුදු පාඨමාලාවක් වශයෙන් ලබා දීම ගුරු විද්‍යාල මඟින් සිදු කරනු ලැබේ. 2018 වර්ෂය වන විට සියළුම නුපුහුණු ගුරුවරු පුහුණු ගුරුවරු බවට පත්විය යුතුය යන සංකල්පය මත පද්ධතියේ සිටිනා සියළු ම නුපුහුණු ගුරුවරුන් පුහුණු පාඨමාලා සඳහා බඳවා ගැනීමට හැකිවන පරිදි පහත සඳහන් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2.පුහුණුව සඳහා සුදුසුකම් ලබන ගුරුවරුන්

2.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අත්සන් සහිත විධිමත් පත්වීම් ලිපි ලබා ඇති රජයේ පාසල්වල සේවය කරනු ලබන ස්ථිර නුපුහුණු ගුරුවරුන්

2.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර ඇති පෞද්ගලික පාසල් නාම ලේඛනයේ ඇතුළත් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ලබා ඇති ගුරුවරුන්,

2.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි වී ඇති පිරිවෙන්වල උගන්වනු ලබන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති නුපුහුණු පිරිවෙන් ගුරුවරුන්,

2.4 මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දූරස්ථ, ප්‍රින්සෙට් , ගුරු විදුහල් පැරණි විෂය නිර්දේශය, උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීමේ ගුරු පුහුණු පාඨමාලාව හදාරා අසාර්ථක වූ බවට අදාළ ගුරු පුහුණු බලධාරීන් විසින් සහතික කර ඇති ගුරුවරුන්,

3. **පාඨමාලාවේ ස්වභාවය**

3.1 මෙම පාඨමාලාව අවුරුදු දෙකක නේවාසික පුහුණුවක් වන අතර, නේවාසික පහසුකම් නොමැති අවස්ථාවල විදුහල්පතිගේ ලිඛිත අවසරය මත ගුරු විදුහලට ආසන්නයේ නේවාසික වීමට අවසර දෙනු ලැබේ.

3.2 පාඨමාලා පැවැත්වීම සඳහා ඇති පහසුකම් අනුව පාඨමාලාව පැවැත්වෙන ගුරු විද්‍යාලය තීරණය වන බැවින් සැමවිටම පදිංචියට ආසන්නතම ගුරු විද්‍යාලය ලබා දීමට නොහැකි වන අතර පාඨමාලාව ආරම්භ කිරීමෙන් පසු කිසිවිටෙකත් ගුරු විද්‍යාලය වෙනස් කල නොහැක.

3.3 ගුරු විද්‍යාලයෙහි පුහුණු කාල සීමාව තුළ වෙනත් පාඨමාලා හැදෑරීම හෝ වෙනත් බාහිර විභාගවලට පෙනී සිටීම හෝ නොකළ යුතු ය. ඒ පිළිබඳව ලැබෙන තොරතුරු හා ලියාපදිංචි වූ පසුව පාඨමාලාව හැරයාම පිළිබඳ ව විධිමත් පරීක්ෂණයකින් පසු විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

3.4 ගුරු පුහුණු පාඨමාලාවන් සඳහා ගුරු විද්‍යාලයකට ඇතුළත් වූ පසු කිසිම පුහුණුලාභියෙකුට තම අභිමතය පරිදි පාඨමාලාවෙන් ඉවත්විය නොහැකි ය. එසේ ඉවත් වුවහොත් රජය විසින් වියදම් කරනු ලැබූ මුදල තක්සේරු කර අධිභාරය සමඟ අය කරනු ලැබේ.

3.5 සෑම අයදුම්කරුවෙකු විසින් ම පහත සඳහන් ලියකියවිලි ගුරු පුහුණුව සඳහා ලියාපදිංචි වීමට කැඳවන දිනයේ දී භාරදිය යුතු ය.

(අ) සම්පූර්ණ කරන ලද ඇප බැඳුම්කරය,

(ආ) ගුරු අධ්‍යාපන පාඨමාලා නිම කිරීමෙන් පසුව පත්කරනු ලබන පාසල්වල (රජයේ ගුරුවරුන් රජයේ පාසල්වල හා රජයේ නොවන ගුරුවරුන් අදාළ පාලක මණ්ඩලය යටතේ) නොකඩවා අවුරුදු 05 ක් සේවය කරන බවට රජය හෝ පාලක මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක පිටපත,

4. 4.1 ගුරු විද්‍යාල විදුහල්පති විසින් අපේක්ෂා කරනු ලබන තත්ත්වයට නොපැමිණීම, සාමාන්‍ය හැසිරීම ගුරු විද්‍යාලයේ විනය ගරුත්වයට අනුකූල නොවන බව වැටහේ නම් හා ඉගෙනීම පිළිබඳ උද්‍යෝගීතාව දැක්වීමට අපොහොසත් වන්නේ නම් පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව ලබන කාල සීමාව තුල ගුරුවරයකු පාඨමාලාවට සහභාගී වීම සහ පැමිණීම 80% ට අඩු වුවහොත් ගුරු විද්‍යාල අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත. එහෙත් යම් අවස්ථාවකදී විශේෂ කරුණු මත අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

4.2 නිවාඩු :

ආයතනික පුහුණුව සඳහා වසර දෙකක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හිමි වේ. මෙම අධ්‍යයන නිවාඩු කාලය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණයෙන් ම යොදා ගැනීම අවශ්‍ය ය. එහෙත් ගුරු පුහුණුව ලබන්නාට අත්‍යවශ්‍ය බවට විදුහල්පති සෑහීමකට පත්වේ නම් පමණක් සීමිත දින ගණනක් අනියම් නිවාඩු ලබා ගත හැකි ය. ඒ සඳහා විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ. මෙසේ ලබා ගන්නා නිවාඩුව වර්ෂයකට දින දහයක් නොඉක්ම විය යුතු ය.

අධික ලෙස නිවාඩු ගැනීම හේතුවෙන් පාඨමාලාවේ අධ්‍යයන කටයුතු වල ප්‍රගතිය අසතුටුදායක බවට කිසියම් අභ්‍යාසලාභියකු පිළිබඳ ව විදුහල්පති වාර්තා කළහොත් පාඨමාලා අධ්‍යයනය අත්හිටුවා නැවත පාසල්වලට යවනු ලැබේ. වෛද්‍ය නිවාඩු සඳහා රජයේ හෝ රජයේ ලියාපදිංචි වෛද්‍ය සභාවේ වෛද්‍යවරයකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

5. ගුරු විද්‍යාලය විසින් පවත්වනු ලබන අඛණ්ඩ ඇගයීම්වලින් සහ දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් සමත්වන අයට ගුරු පුහුණු සහතිකය පිරිනමනු ලැබේ.

6. **වැටුප් පරිමාණය**

ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළව පසුකාලීන සංශෝධනයන්ට යටත්ව පුහුණු ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පසු අදාළ වන වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

7.

7.1 සෑම අයදුම්කරුවකු ම තමා පත්වීම් ලද විෂයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය. එහෙත් විශේෂ අධ්‍යාපන පාඨමාලාවට පමණක් වෙනත් විෂයයන් ගෙන් පත්වීම් ලද ගුරුවරුන්ටද ඉල්ලුම් කළ හැකි ය. රජයේ පත්වීම් ලද ගුරුවරුන්ගේ පත්වීම් විෂය, පත්වීම් ලිපියේ සඳහන් නොවන අවස්ථාවලදී තමා අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත්වූ විෂයයන් ගෙන් ගුරු පුහුණුව ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි ය. ඒ සඳහා අදාළ විෂයන් උගන්වන බවට අනුමත කාලසටහනෙහි පිටපතක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත බඳවා ගත් අයගේ පත්වීම් ලිපියේ පත්වීම් විෂයය සඳහන් නොවන විටක දී එම පත්වීම ප්‍රාථමික ගුරු පත්වීමක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පෞද්ගලික හා පිරිවෙන් ගුරුවරුන්ගේ පත්වීම් ලිපිවල විෂයය සඳහන් නොවන අවස්ථාවලදී තමන් උගන්වනු ලබන විෂයය අනුව පුහුණුව සඳහා තෝරා ගැනේ. ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුත් අනුමත කාල සටහනේ පිටපතක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

7.2 පුහුණුව ලබාදෙන පාඨමාලා පහත පරිදි වේ.

<u>පාඨමාලාවේ නම</u>

| | |
|---|---|
| සිංහල | චිත්‍ර |
| ප්‍රාථමික අධ්‍යාපනය | සංගීතය |
| සමාජ විද්‍යාව | නැටුම් |
| විද්‍යාව | අරාබි |
| ගණිතය | විශේෂ අධ්‍යාපනය |
| කෘෂි විද්‍යාව | හස්ත කර්මාන්තය හා තාක්ෂණය |
| ගෘහ විද්‍යාව | වාණිජ |
| ඉංග්‍රීසි | දෙමළ |
| බුද්ධ ධර්මය | ශාරීරික අධ්‍යාපනය |
| ක්‍රිස්තියානි / රෝමානු කතෝලික ධර්මය | දෙවන බස (සිංහල / දෙමළ) |
| හින්දු ධර්මය | තොරතුරු තාක්ෂණය |
| ඉස්ලාම් ධර්මය | උපදේශනය |
| පුස්තකාල විද්‍යාව | |

8. ගුරු පුහුණුව සඳහා ඉල්ලුම් කිරීම

8.1.ගුරු පුහුණුව සඳහා ඉගැන්වීම් කරන පාසලේ විදුහල්පති මාර්ගයෙන් කැඳවීම් ලිපි යොමු කළ යුතු අතර ඒ අනුව කැඳවීම් ලිපියට අමුණා ඇති අයදුම්පත සම්පූර්ණ කර අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය

8.2 සෑම නුපුහුණු ගුරුවරයෙකුට ම ගුරු පුහුණුව අනිවාර්ය බැවින් ගුරු පුහුණුව සඳහා ගුරුවරයා නිදහස් කිරීම විදුහල්පති විසින් අනිවාර්යෙන්ම සිදු කළ යුතුය.

8.3 2.1 -2.4 යටතේ ලැබෙන අයදුම්පත් සියල්ල ගුරු පුහුණුව සඳහා සලකා බැලෙන අතර අමාත්‍යාංශය මඟින් ගුරු විද්‍යාල වෙත යවන නාම ලේඛණය අනුව ගුරු විදුහල්වලින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. ගුරු විද්‍යාලවල පවතින ඉඩ පහසුකම් පදනම් කරගෙන අදාළ වර්ෂයට බඳවා ගන්නා ප්‍රමාණය අමාත්‍යාංශය මඟින් තීරණය කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල